ක්‍රි. ව. 2013 සැප්තැම්බර් 16 සඳුදා
05 වෙළුම - 45 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



Photos By: Shehal Joseph flickr

## සයුරෙන් මතුව විත්, සුනාමියටද නොසැලී, දකුණු ලක සුරකින

# මාතර “අප දේව අම්මා”

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# ජංගම දුරකථන කුඩා ඔබට සුදුසුද?

## ආදරණීය දුවේ පුතේ...

අද මෙම පිටුවෙන් කෙළින්ම ඔබෙන් ප්‍රශ්නයක් අසමින් තමයි මෙම කතුවැකිය ලියැවෙන්නෙ. ජංගම දුරකථන පුංචි ඔබට සුදුසුද? සාමාන්‍යයෙන් දුරකථනයක් භාවිත කරන්නේ ඇමතුමක් ගන්නටයි. තවත් කෙනෙකුට කථා කරන්නටයි. ඉක්මන් පණිවිඩයක් ලබා දීමටයි. ඉන්න තැන , පැමිණිය යුතු ස්ථානය පිළිබඳව හෝ හමුවීමට නොහැකි නිසා සුව දුක් විමසා මිත්‍රත්වය , ඥාතීත්වය තවදුරටත් තහවුරු කර ගැනීමටයි.

දැන් ඔබට ආදර දුවේ, පුතේ, ඔබේ දෙමව්පියන් ජංගම දුරකථනයක් සමහර විට ලබා දීලා ඇති. හැබැයි ඒ ලබා දී තිබෙන්නේ එක්තරා අරමුණක් වෙනුවෙන්ම පමණයි. පාසල් යාමට පෙර ඔබ ගමන් ගන්නා වාහනයෙ රියදුරාට කථා කරන්නට, පාසලේ ඔබට අවශ්‍යතාවයක් සිදුවුවහොත් දෙමව්පියන් ඇමතීමට, පාසලෙන් පසු අමතර පංතියකට සහභාගි වෙනවා නම් එකී පංතිය ආරම්භ කරන වේලාව, අවසන් කරන වේලාව, ඉන්පසු ඉන්න ස්ථානය ආදී දෑ ගැන දෙමව්පියන්ව දැනුම්වත් කිරීමටයි. එලෙසම පාසල් රථය යම් අකරතැබ්බයකට මුහුණ දුන හොත්, එය පැමිණීමට ප්‍රමාද වුව හොත් හදිසියේ අසනීප වූවහොත් ආදිය ගැන දෙමව්පියන්ට දන්වා සිටීමටයි. මේ කරුණු අරබයා පුංචි ඔබ ජංගම දුරකථනයක් මේ වර්තමානය තුළ පාවිච්චි කිරීම සාධාරණ බව හැඟී යනවා. මන්ද මඟ තොට අද ඇති බාධා ගැන ඒ වගේම නාඳුනන අයගෙන් පුංචි ඔබ ප්‍රවේශම් වීම මේ දිනවල ඉතාමත් අත්‍යවශ්‍ය වීම ආදී කරුණු නිසා.

ආදර දුවේ, පුතේ, ඔබේ දෙමව්පියන් ඉතාමත් ආදර බරව හා ඔබව ප්‍රවේශම් කිරීමේ ඒකායන අරමුණ ඔස්සේ හා ඉහත සඳහන් කරුණු නිසාම ජංගම දුරකථනයක් ඔබ අතට පත් කර දී තිබුනත් අද බොහෝ විට සිදුවී තිබෙන්නේ ඉටු විය යුතු දේට වඩා ඉටු නොවිය යුතු දේමයි. ඒ බව තේරුම් යන්නේ දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල වගේම රූපවාහිනි ප්‍රවෘත්ති වල පලවන, කියවෙන සමහර දෑ ගැන අවධානය යොමු කරන විටයි.

අද ජංගම දුරකථනය සමහර අපේ කුඩා දරුවන්ගේ ආධ්‍යාත්මය නැත්තටම නැතිකරලා. ඡායාරූප ගැනීමේ පහසුකම් ඇති ජංගම දුරකථනය පුංචි ඔබට අකැපයි. සමහර දෙමව්පියන් මේ බව තේරුම් ගන්නේ නැතිව නවීන පහසුකම් වලින් අනූන මිල අධික ජංගම දුරකථන ඔබ අතට පත් කරනවා. එක් පැත්තකින් ඔබේ අධ්‍යාපනයට එය බාධාවක්. අනෙක් අතට ඔබ නවීන මෙවලම් වල වහල් තත්ත්වයට පත්වෙලා., නැතිනම් ඔබව ඒ තත්ත්වයට ඇද දමලා. අද සමහර පාසල් ළමුන් තමන්ගේ ජංගම දුරකථන වල අසභ්‍ය පින්තූර තැන්පත් කරගෙන. මේ පිළිබඳව මෑතකදී පොලිස් වාර්තාවකින් සම්පූර්ණ විස්තරයක් එළි දක්වා තිබුනා. අසභ්‍ය චිත්‍රපට වල කොටස් අසභ්‍ය පින්තූර පමණක් නොවෙයි. සමහර විට සමහර ළමුන් තමන්ගේම මිතුරන්ගෙ, මිතුරියන්ගේ නිරුවත් පින්තූර පවා තමන්ගෙ ජංගම දුරකථන වල තැන්පත් කර ගැනීමට පෙළඹිලා. දෙමව්පියන්ට මේ ගැන පූර්ණ අවබෝධයක් නැති නිසා සමහර දරුවන් මෙයින් අනිසි ප්‍රයෝජන අරගෙන තමන්ගේ අනාගතය අඳුරු කර ගන්නවා. තමන්ගේ ජීවිතය, තමන්ගේ දහම තමන්ගේ ආධ්‍යාත්මය විනාශ කර ගන්නවා.

මේ ජංගම දුරකථන හා ඒවායේ අඩංගු අසැබි දෑ නිසා, ඒවා ගුරුවරුන් දැන ගැනීම නිසා, ශිෂ්‍ය නායක නායිකාවන්ගේ අතට අසු වීම නිසා මේ වන විට පාසල් දරුවන් ගණනාවක්ම සිය දිවි පවා හානි කරගෙන තිබෙනවා. බලන්න අවශ්‍ය දෑ පමණක් තමන්ට ලබා දුන් මේ ජංගම දුරකථනයෙන් ඉටු කර ගන්නේ නැතිව අනවශ්‍ය දෑ කිරීමට ගොස් ජීවිතය අඩාල කරගෙන, නැති කරගෙන. ඉතින් දරුවන්ගේ දෙමව්පියන්ට අද ඇතිවී තිබෙන තත්ත්වය දැනෙන වේදනාව. කෙතරම්ද යන්න තෙරේනවා නේද?.

තවත් ප්‍රශ්නයක් තමයි, මේ ජංගම දුරකථන වලින් ''ගේම් ප්ලේ'' කිරීම නැතිනම් විවිධ ක්‍රීඩා අංග කිරීමට පෙළඹීම. මේ සමහර තැන්පත් කොට ඇති ක්‍රීඩා පවා දරුවන්ගේ මනස විකෘති කරන ක්‍රීඩා, අනිසි චර්යාවන් පුරුදු කරන ක්‍රීඩා. දෙමව්පියන් සිතන්නේ තමන්ගේ දරුවන් අහිංසකව මේ සුලු ක්‍රීඩාවක් ජංගම දුරකථනයෙන් කරනවා කියලයි. නමුත් එයින් තමන්ගෙ දරුවන්ගේ මනස විකෘති කරනවයි කියලා අවබෝධ කර ගන්න පුළුවන් දෙමව්පියන් පවා අප අතර විරලයි. ඉතින් ආදර දුවේ, පුතේ, ප්‍රයෝජනයට ලැබුණු මේ ජංගම දුරකථනය ඔබට ඔබේ ආධ්‍යාත්මයට හානි කරන බව ඔබට දැනෙනව නම් කරුණාකර එය ඉවත දමන්න. එහි වහලකු වන්න එපා. ඒ කුඩා තාක්ෂණ මෙවලමට ඔබේ අනාගතය පාවා දෙන්න එපා. ජීවිතය විනාශ කර ගන්න එපා.

ඒ නිසා ඔබම අවංකව කල්පනා කර බලන්න. ජංගම දුරකථනයක් ඔබට සුදුසුද නැද්ද කියා. සුදුසු යැයි හැඟෙන්නේ නම් නිවැරදිව නිසි පරිදි අවශ්‍යතාවයට පාවිච්චි කරන්න. නුසුදුසු බව ඔබටම හැඟෙන්නේ නම් එය ඉවත දමන්න දෙවරක් හිතන්න එපා.

**ඔබට ජේසු පිහිටයි**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




## ඒදිනෙදා ජීවිතයට යාච්ඤා

## කමා බැතිය
## පශ්චාත්තාපික දේව ප්‍රසාද නිධානය

නිරෝගීව සිටිනු සඳහා ශාරීරික පවිත්‍රකම අවශ්‍යය. තුවාල හෝ රෝග සුවපත් කරනු සඳහා ඖෂධයක් පාවිච්චි කළ යුතුය. එමෙන්ම පව් නමැති ආත්මික රෝගයන්ගෙන් අප ආත්ම ආරක්ෂාකර ගැනීමට හෝ සුවපත් කිරීමට බොහෝ විට පාපොච්චාරණය රැකුලකි.

### පාපොච්චාරණයට සූදානම් වීම.

පළමු කොට තම පව් පැහැදිලිව මතක්කර ගැනීම සඳහා ස්ප්‍රීතු සාන්තු වහන්සේගේ පිහිටාලෝකය ඉල්ලා ගන්න.

දේව පනත් හෝ ශුද්ධවූ සභාවේ පනත්වලට අකීකරු වීමෙන් හා ප්‍රේමයට පටහැනි වීමෙන් පව් සිදුවන හෙයින් එකඑක පනත ගැන විමසා බලන්න.

තවද ක්‍රියාවෙන් පමණක් නොව සිතින්ද වචනයෙන්ද පව් කිරීමට ඉඩ තිබෙන බව අමතක නොකරන්න.

බොහෝවිට පාපය බරපතලද සුළුද කියා තීරණය කළ හැක්කේ හේතුව හෝ අවස්ථාව ගැන විස්තර දෙන විට පමණයි. ඒ නිසා අවංක ලෙස එබඳු විස්තර දෙන්න.

මරණීය පව් ගැන පුළුවන් තරමින් ස්ථිර ගණන දීම අවශ්‍යය. සුළු පව් ගැනද අඩු තරමින් දවසකට හෝ සතියකට හෝ මාසෙකට කීවරක්ද කියා දැන්වීම සුදුසුය.

අවංකව තම සියළු පව් මතක් කළාට පසු ඒවා ගැන අවංක දුක්මනස්ථාපයක් අප හද තුළ ඇති කරන්නට වෑයම් කරමු අපගේ පව් ගැන දුක්මනස්ථාප වීමට ප්‍රධාන හේතු.

1. අපගේ පව් මගින් යහපත් පියාණන් වහන්සේට ප්‍රති ප්‍රේමය නොදක්වා, දුක් දුන් නිසාය.
2. අපගේ පව් නිසා ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේව කුරුසයේ ඇණ ගැසූ නිසාය.
3. අපගේ පාපවලට දේව දඬුවමක් නියමවූ නිසාය.

### පාපොච්චාරණයට පෙර යාච්ඤාව

සර්ව කරුණා භරිත වූ මාගේ ජේසු ස්වාමිදරුවෙනි. ඔබ වහන්සේ මාව වැරදි කාරයෙක් කොට තීන්දු නොකරන පිණිස මම වැරදිකාරයා බව එළිදරව් කර උච්චාරණය කරන්ට ඕනෑ වන්නේ ය. ඒ පිණිස මාගේ සියලු පාපවල් මා දැනගන්නට ඕනෑ හෙයින් සිතින් වචනින් ක්‍රියාවෙන් නිතර මම කළ සියලු පාපවල්ද ඒ ඒ පව් ගණන්ද, ප්‍රමාණයද දැනගන්නටත් ඒවාට සැබෑ ලෙස දුක්මනස්ථාප වෙන්නටත්, ඒවා උච්චාරණය කරන්නටත් මින්මතු දැනුවත්ව මොනම පවක්වත් නොකරන සැටියට ස්ථිරව සහතික වෙන්නටත් ඔබගේ දිව්‍ය ස්ප්‍රීතු තුමන්ගේ ඥාන එළිය හා වරප්‍රසාදයත් අසරණ පව්කාරවූ මට දෙවා වදාළ මැනව.

පව්කාරයන්ගේ අඩක්කළමවූ කන්‍යා මරියතුමියනි, දයාබර වූ මාගේ මෑණියනි ගැත්තාවූ මට හොඳ පාපොච්චාරණයක් කරන මෙන් ඔබ මා උදෙසා යාච්ඤා කරනවා සොඳේ.

---

පසුගිය ලිපිය හා සබැඳේ

## ජේසුව පළමු වරට ලබන ළමුන් වෙනුවෙන්මයි.

### පුංචි මරීනා ජේසු ලැබූ දා

සෙනසුරාදා උදෑසනම පුංචි මරීනා සුරංගනාවියක් වගේ ඇඳගෙන නැන්දගේ පවුලේ අයත් එක්ක දේවස්ථානයට ගියා. ළමයි පේළි සෑදී දෙමව්පියන් එක්ක පෙරහරේ යන්න සූදානම් වෙද්දි පුංචි මරීනාට පුංචි දුකක් දැණුනා ගෙදර අයව මතක් වෙලා. මරීනාගේ නැන්දා එක පැත්තක සිට ගත්තා. හදිසියේ ඉස්සරින්දා හවස මේ ආරංචිය දැන ගත්ත පුංචි මරීනගේ පුංචි මාමාත් දේවස්ථානයට ආවා. එයා අනිත් පැත්තේ හිට ගත්තා. මුව අග පුංචි සිනාවක් රඳවාගෙන ගීතිකාවක් ''පොඩි පොඩි කුරුල්ලනේ'' ගයමින් පුංචි මරීනා අනිත් අය එක්ක දේවස්ථානයට ඇතුළු වුණා. පුංචි මරීනා හරිම ආශාවෙන් දිව්‍ය පූජාවට සහභාගි වී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලබා ගත්තා. පූජාව නිම වුනාට පසුව ඇය පුංචි මාමාගේ පා පැදියේ නැගී ඇගේ ගමට ගියා.

වෙල් යායවල් මැද්දෙන් ඉද්ද බෝවිටියා රත්මල් පිරුණු ලස්සන ඕවිටි පහු කර ගෙන රතුපාට ගුරු පාර දිගේ මාමා බයිසිකලය පැද්දා. පාර මැදින් ගලා ගිය ඇල පාරක් නිසා මරීනාට බයිසිකලයෙන් බහින්න සිදුවුණා. ''දුව බැහැලා පරිස්සමින් එගොඩට යන්න ගවුම පරෙස්සම් කර ගන්න. තවම අම්මා දැක්කෙත් නෑනෙ''

මාමා ඇගේ සපත්තු දෙක ගලවලා බයිසිකලයේ එල්ලුවා. ඉටිපන්දම මාමා ගේ බෑගයේ දැම්මා. මරීනා එගොඩ වෙන්න යනකොට ඇල පාරේ එහාට මෙහාට පීනන දණ්ඩි පැටව් රැනක් දැක්කා. මරීනාට හැම දෙයක්ම අමතක වුණා. ගවුමත් තෙමාගෙන දණ්ඩි පැටව් ටිකක් අල්ල ගත්තා. ''මරීනා දුව මේ මොනවද ඔය කරන්නෙ ගවුමත් තෙමෙනවා නේද? දුවගේ අම්මා ළඟට ලස්සනට යන්න එපායැ.''

''අනේ පුංචි මාමෙ මං මේ මාළු පැටව් ටික මල්ලිට දෙන්න ඕන. අද නංගීටයි මල්ලිටයි දෙන්න විස්කෝතු නැනේ'' ''හරි හරි මං අරන් දෙන්නම්කෝ විස්කෝතු මුලක් පල්ලෑහැ ටෝනි මාමලාගේ කඩෙන්'' පුංචි මරීනා අතේ උන්නු මාළු පැටව් ටික ඇලටම දැම්මා. මාමාගේ බයිසිකලයෙ නැගලා ආපසු ගමන ආරම්භ කළා.

එල්සි මුදලිගේ නැන්දාගෙන්

**ඉදිරියට ......**

# කල්පනාවෙන් වැඩ කරමු

**දෙවෙනි පන්තියේ ඉගෙන ගන්නා රනිල්ට මේ දවස් වල හරිම ආසයි ඒ ඉස්කෝලෙ නිවාඩු කාලේ නිසා රනිල්ට හොඳට සෙල්ලම් කරන්න පුලුවන් බැවින්. අම්මා හැමදාම වත්ත අතුග ාන වෙලාවට රනිල් එයාගෙ පොඩි බයිසිකලයත් අරන් වත්තට එනවා.**

රනිල් බයිසිකලයට නැංගාම ගේ වටේටම බයිසිකලය පදිනවා. දවසක් යක්ත අතුගෑම නතර කළ අම්මා නිවස ඇතුලට ගියා. රනිල් තාමත් වත්ත බයිසිකල් පදිනවා. හදිසියේම අම්මාට ඇසුණා "අම්මා..." කියා රනිල් හයියෙන් කෑ ගසනවා. අම්මා ගෙයින් එළියට දුවගෙන ආවා. රනිල් ගේ පියා වත්තේ කොනක පස් ගොඩ කර, වටේටම ගල් දමා ලස්සන "පතොක් උද්‍යානයක්" ඉදි කර තිබුණා. රනිල් පතොක් ගස් මැද්දේ වැටී ඉන්නවා අම්මා දුටුවා. "මාව ඉක්මනට එළියට ගන්න අම්මා. කටු ඇනිල හරියට රිදෙනවා." රනිල් ඇඬුම්බරව කීවා.

අම්මා බොහොම සීරුවෙන් දෙඅත් දිගු කර රනිල් ගේ අත් වලින් අල්ලා ගෙන ඔහුව උස්සා එළියට ගත්තා.
"ඇයි දෙයියනේ පුතාගේ ඇඟ පුරාම පතොක් කටු නේද? එන්න ඉක්මණටම ගෙට යන්න අපි. හරි වෙලාවක් යයි මේ කටු ටික අරන් දාන්න." අම්මා රනිල්ව නාන කාමරයට එක්ක ගියා ලොකු වතුර බේසමකට විෂබීජ නාශක "ඩිටෝල්" ස්වල්පයක් දමා මිශ්‍ර කළා. ඒ ඩිටෝල් වතුරෙන් අතපය සෝදා අම්මා හෙමින් සිරුවේ පතොක් කටු එකින් එක ගලවන්නට පටන් ගත්තා. රනිල්ට හොඳටම රිදුණා. නමුත් දත් හපාගෙන වේදනාව ඉවසාගෙන හිටියා. අම්මත් පුලුවන් තරම් මහන්සි ගත්තා නො රිදෙන ලෙස කටු ටික එළියට ගන්න. කටු අදින ගමන් සැරෙන් සැරේ අම්මා රනිල් ගේ ඔලුව අත ගෑවා.




"ඉක්මනටම කටු ටික එළියට ගන්න අම්මේ, දැන් නම් මට හරියටම රිදෙනවා." "ඔව් පුතා, මට තේරෙනවා, මං පුලුවන් තරම් ඉක්මණට ගන්න තමයි උත්සාහ කරන්නේ. පරිස්සමින් සේරම එළියට ගන්න එපායැ. කටු කෑලි ඇඟ ඇතුලේ ඉතිරි වුනොත් ඒවා පැසවන්නත් බැරි නැහැ. තව චුට්ට වෙලාවක් හොඳ පුතා වගේ ඉවසාගෙන ඉන්නකො. තාත්තාත් සන්තෝෂවෙයි මගෙ පුතා පුංචි විරයෙක් වගේ ඉවසාගෙන හිටිය කියල ඇහුවම." පතොක් කටු ගලවන ගමන් අම්මා රනිල්ට කුරුල්ලෙක් ගැන පුංචි කතන්දරයක් කීවා. කතන්දරය නිසා රනිල්ට වේදනාව තරමකට අමතක වුණා.

ඇනී තිබුණු සේරම කටු අරන් දාන්න අම්මාට පැය බාගයකටත් වඩා වැඩි වෙලාවක් ගියා. නැවත සැරයක් හොඳින් සබන් ගා අම්මා රනිල්ව නෑවුවා. කටුවල රිදිල්ල මඟ හැරෙන්න අම්මා රනිල්ගේ අත්වල සහ කකුල්වල ක්‍රීම් ගෑවා. ඉන්පසු අම්මා රනිල්ව වඩාගෙන කුස්සියට ගොස් කිරි වීදුරුවක් දුන්නා. "මදැ බයිසිකල් පදින්න ගිහිල්ලා වෙච්ච දේ". කියා අම්මා රනිල්ගේ ඔලුව අත ගෑවා. කිරි බොන ගමන් අම්මා ඇහුවා "පුතාව කොහොමද පතොක් ගාල මැද්දට වැටුනේ" කියලා. රනිල්ට ටිකක් ලැජ්ජා-වෙන් වගේ බිම බැලුවා. නමුත් දැන් අම්මගෙ ප්‍රශ්නෙට උත්තර දෙන්නත් එපායැ. "මං බැලුවා මට ඇස් දෙක වහගෙන හැන්ඩ්ල් එක අල්ලන්නේ නැතිව බයිසිකලේ පදින්න පුලුවන්ද කියලා මං කෙලින්ම ගේට්ටුව ළඟටම පදින්න ගියේ ටිකක් වෙලා පැදගෙන යනකොට වැලි වැඩිය තියන තැනදි බයිසිකලේ හැන්ඩ්ල් එක එකපාරටම හැරිල මාව විසිවුණා."
ඇයි දරුවෝ ඇස් දෙක පියාගෙන කොහොමද බයිසිකලේ පදින්නේ?
" අම්මා විමසුවා. "එහෙම පුලුවන්ද කියලා බලන්න තමයි මං ඇස් දෙක පියාගෙන පදින්න බැලුවේ" යැයි රනිල් ලජ්ජාවෙන් කීවා. අම්මට හිනහ ගියා. "මදැ ඇස් දෙක වහගෙන පරික්ෂණ පවත්වන්න ගිහිල්ලා මගෙ පැටියට වෙච්ච දේ" අම්මා රනිල්ගේ ඔලුව අත ගෑවා. "පුතා ආයෙම එහෙම මේ වගේ වැඩ කරන්න එපා හොඳද?" රනිල් ඔලුව වැනුවා. "ඉතිං පුතා කියන්න බලන්න මේ වෙච්ච වැඩෙන් පුතා ඉගෙන ගත්ත දේ මොකද්ද කියලා."ඇස් දෙක වහගෙන බයිසිකල් පදින්න හොඳ නෑ කියලා." රනිල් කීවා. "වෙන මොනවද පුතා. ඉගෙන ගත්තේ? අම්මා ඇසුවා. "පතොක් කටු ඇණුනම රිදෙනවා කියලා" අම්මා
බොහෝම අමාරුවෙන් සිනහව නතර කර ගත්තා. පුතාට අම්මත් කියලා දෙන්න ද තව එක පාඩමක් ?" "හා" කියා රනිල් ඔලුව සෙලෙව්වා. අපි මොන වැඩේ කළත් බොහොම කල්පනාවෙන් ඒක කරන්න ඕනි. කියලා." රනිල් අම්මා කිවු දෙය තේරුම් ගත් බව පෙන්නමින් ඔලුව සෙලෙව්වා.

✍ ෆ්‍රීඩා විල්ලවරායන්
ටොරොන්ටෝ , කැනඩාව

## වත්තල, ගල්වැටිය දහම් ළමුන්ට තෙදිනක කඳවුරක්



කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ සංකල්පයකට අනුව, වත්තල , ගල්වැටිය සාන්ත මරියා දහම් පාසලේ ළමුන්ගේ අධ්‍යාත්මික පෝෂණය සඳහා තෙදින විශේෂ දහම් කඳවුරක් පසුගියදා ගල්වැටිය දෙව්මැදුරු පරිශ්‍රයේ දී පැවැත්විණි.
දහම් පාසල භාරව කටයුතු කරන දයානි පීරිස් මහත්මිය ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය සංවිධානය කළ මෙයට ළමුන් 50 ක් පමණ සහභාගී වූහ. මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ, සහයක ගරු ක්‍රිෂාන් ජයශාන්ත , ගරු මාල් වර්ණශාන්ත යන පියතුමන්ලා හා ගරු සිරිලින් ය.එ.නි. සොහොයුරිය මෙහි සාර්ථකත්වයට විශේෂ දයකත්වයක් දැක්වූහ. මීට සහභාගී වූ පිරිස ඡායාරූපයෙන් දිස්වේ.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි.**

# කුරුළු පැටවකු කතාකරයි.

තටු සිඳී කූඩුව තුළ තනි වූ මා දුකින් කල් ගෙවමි
විලාපදෙමින් සතර අත ඉගිලෙන
අම්මාගෙ හඬ මාගේ සිත කම්පා කරවයි.
රෑන් පිටින් ඈත අහසේ ඉගිලෙන
මාගේ යාළුවෝ දැක මා නෙත් පියා ගනිමි
අම්මාගේ තාත්තාගෙ උණුසුම ,
සෙනෙහස මතක් වූ විට
මට දැනෙන්නේ ලොකු දුකකි
එවිට මම කඳුළු සළමි.
ඈත අහසේ ඈතට ම ඉගිල යන්නට
මට සිතෙයි මා වැනි තවත්
මාගේ යාළු කුරුලු පැටවකුට
මෙවන් දුකක් නොවේවායි පතමි.




**දුලර්ෂා මෙරීනා දිල්ෂානි**
**08 ශ්‍රේණිය**
ජපමාල මාතා දහම් පාසල
කුඩාමඩුවැල්ල - (තොඩුවාව මීසම)

# නියඟය

වැහි පොදක් නොදුටු පොළව ඉරි තලා ඇත
දුකින් බරව ගහකොළ වියලි ඇත
ගම්මානේ ලස්සන කර ගලාගිය
දියපාර නැත අද දකින්නට

දිය පිපාසයෙන් සතුන්ද අසරණව ඇත.
අහසේ වැහි වළාකුළු නැත්තේ කොහේ ගිහින්ද
නියඟය නිසා දුක් විඳිනා සැම ට සතුටු වන්නට
නියඟය නිමවී ඉක්මනින්ම වැස්ස ලැබේවා



**නිලක්ෂි ශෂිකලා**
**05 ශ්‍රේණිය**
සාන්ත මරියා දහම් පාසල - හාල්දඬුවන




# ආදර මගේ ජේසුනි

ආදර මගේ ජේසු සමිඳුනේ
ඔබ වහන්සේව මා ලබනා
දිනය ලංව ඇති නිසා
මගේ සිතට සතුටක් දැනේ

**සහන් ක්ලෙමන්ට් ශාවින්ද**
**04 ශ්‍රේණිය**
ශා. ජෝශප් දහම් පාසල - වෙන්නප්පුව

# සිත් හැරීම

හැරදමා යන කල මා ඔබව,
නොදැනුණා නොවේ ඔබේ ආදරේ
මගේ ජේසුනි .........
ඔබ තරම් ප්‍රේමයේ උල්පතක්
මේ ලොව තවත් නැත
ඔබට පමණයි ආදරේ
මගේ ජේසුනි.....




**අශානි නවින්ද්‍යා**
**09 ශ්‍රේණිය**
සින්දත්‍රිය දහම් පාසල
(වයික්කාල මීසම )

# සඳ ණයගැතියි !

මව් කුසෙහි පිළිසිඳි
ගව මඩුවේ ඉපදුණි
සාමයේ කුමරුණී
ලෝ තලය බැබලුණී


මව් පියන් සනසලා
ලෝ වැසියන් සනසලා
පව් බරින් මුදවලා
ලෝකයම ගලවලා

ජීවිතය පුද කළේ
කුරුසියෙදි ජේසුනි
ණය ගැතියි ජේසුනි
ජීවිතේ මා සදා.......




**ඉරේෂා මධුවන්ති**
**11 ශ්‍රේණිය**
කන්දාලය රජයේ සිංහල විදුහල
සින්නපාඩුව , කොත්තන්තිව්

# මා දිවියේ ආලෝකය



මගේ ජීවිතයට පහන් ආලෝකයක් වූ
පියකරු දෙනෙත් අග කඳුළු කැට හංගා ගෙන
සතුට මතු කරවමින් ජීවිතය ඉතා සැහැල්පුවෙන්
ගෙවන බව පෙන්වමින් අනේක විද දුක් ගැහැට
මැද අපගේ දිවිය එළිය කළ
ඔබ අපට දෙවිඳුන් දුන් අගනා තිළිණයකි

**ෂෙහානි අයේෂා සෙව්වන්දි**
**09 ශ්‍රේණිය**
ශා. ප්‍රැන්සිස් සේවියර් දහම් පාසල
ගුරුගල්ල

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව ඇසුරින් - (ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය)

## කතෝලික ධර්මය II ප්‍රශ්න පත්‍රයේ අනිවාර්ය ප්‍රශ්නය සඳහා ඉදිරිපත් වූ ප්‍රශ්න එකතුව (2008 - 2012)

**1. ජීවිතය දෙවියන් වහන්සේගෙන් ඔබ ලබන තිළිණයකි. ශුද්ධවූ බයිබලයේ මෙම කථා පුවත සඳහන් ග්‍රන්ථය නම් කරන්න. (2008 /02)** ★ උප්පත්ති පොත

**2. ශුද්ධවූ පාවුළුතුමන්ගේ 1 කොරෙන්ති ලිපියට අනුව මවනු ලැබූ මිනිසා සතු ශරීර වර්ග දෙක නම් කරන්න. (2012 /01)**

★ ස්වාභාවික ශරීරය / ආධ්‍යාත්මික ශරීරය

**3. උත්පත්ති පොතේ පළමු පරිච්ඡේදයේ සඳහන් ආකාරයට දෙවියන් වහන්සේ මිනිසාට අණ කළේ කුමක්ද? (2011 /01)**

★ දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්, ''නුඹලා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී, පොළව පුරා පැතිර එය යටත් කරගන්න. මුහුදේ මසුන් කෙරෙහි ද, අහසේ පක්ෂීන් කෙරෙහි ද, පොලොවේ සැරි සරන සියලු සතුන් කෙරෙහි ද බලය පවත්වන්න'' යි ඔවුන්ට වදාළ සේක. (උත්පත්ති 1/28)

**4. උත්පත්ති පොතේ සඳහන් විස්තරයට අනුව දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමකට ඇතුළු වූ පාර්ශවයන් දෙකක් නම් කරන්න. (2012 /02)** ★ ආදිමව්පියන් / නෝවා / ආබ්‍රහම් තුමා

**5. ආදි පීතෘ ආබ්‍රහම්ගේ ජීවිතයේ පිළිබිඹු වූ විශේෂිත ලක්ෂණය කුමක්ද? (2009 /01)** ★ ගැඹුරු විශ්වාසය

**6. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දු දෙකක් ලියන්න. (2010/01)**

★ දෙවියන් වහන්සේ ආබ්‍රහම් මගින් විශාල ජාතියක් ඇති කිරීම
★ දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දේශයක් දෙන බව

**7. පාරාවෝ රජුගේ වහලුන් බවට පත් වූ ඉශ්‍රායෙල් ජනතාව කළ කර්මාන්ත දෙකක් නම් කරන්න. (2012/03)**

★ කුඹල් කර්මාන්තය ★ ගඩොල් කර්මාන්තය
★ විවිධ කෘෂිකර්මාන්තය

**8. මිනිසාව කිසිම දිනක දෙවියන් වහන්සේ අසරණ නොකරන බව සනාථ කෙරෙන පැරණි ගිවිසුමේ කේන්ද්‍රගත සිද්ධිය නම් කරන්න. (2008/01)** ★ නික්මයාමේ සිද්ධිය.

**9. දිවැසිවරුන්ට පැවරුණු ප්‍රධාන කාර්ය දෙකක් සඳහන් කරන්න. (2011/02)**

★ ඒක දේවවාදය සඳහා ඉශ්රායෙල් ජනතාව යොමු කිරීම
★ මෙසියානික බලාපොරොත්තුව ජනතාව තුළ ඇති කිරීම
★ ගිවිසුම් ජීවිතයට ඉශ්රායෙල් ජනතාව යොමු කිරිම
★ සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටිම

**10. දෙවියන් වහන්සේ මිනිසාට අනාවරණය වු ආකාර දෙකක් ලියන්න. (2009/03)**

★ දේව මැවිල්ල තුළින් ★ දේව වචනය තුළින්
★ දිවැසිවරුන් මඟින්
★ ජේසුස් වහන්සේ මගින් (දෙවියන්වහන්සේගේ පූර්ණ අනාවරණය)

**11. දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන්ගේ පුත්‍රභාවය හෙළි කළ අවස්ථා දෙකක් ලියන්න (2010/03)**

★ ජෝර්දාන් නදියේ දී ස්නාවක ජුවාම් තුමාගෙන් බෞතිස්ම ස්නාපනය ලබන විට
★ අන්‍යරූප විලාශ විමේ සිද්ධිය තුළින්.

**12. ජේසුස් වහන්සේ ඉගැන්වු මෙම ඉගැන්වීම සම්පූර්ණ කරන්න. "මා ඔබට ප්‍රේම කළාක් මෙන් .......... " (2008/09)**

ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න

**13. කිසියම් පුද්ගලයකු භාග්‍යවන්ත දැයි මැනිය හැකි ක්‍රම දෙකක් නම් කරන්න (2011/09)**

★ තෘප්තිමත්ව සිටිම ★ දෙවියන් වහන්සේ දර්ශනය කිරීම
★ ජේසුස් වහන්සේ වෙනුවෙන් සම්පූර්ණයෙන් කැපවී සිටිම
★ දෙවියන් වහන්සේගේ විශ්‍රාමයට ඇතුළුවීම

**14. ක්‍රිස්තුන් වහන්සේ ප්‍රසිද්ධ ජීවිතයේදී උන්වහන්සේ සමඟ දේව මෑණියෝ සිටි අවස්ථා දෙකක් නම් කරන්න. (2012/10)**

★ කුරුස ගමනේදී (පාදනමස්කාරයේ හතරවන ස්ථානය)
★ කුරුසියේ පාමුල (ජොහාන් 19/26) 6

**15. පෙන්තකොස්ත මංගල්‍ය දින ශ්‍රාවකයන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරීම සංකේතවත් කරන සලකුණු දෙකක් නම් කරන්න. (2010/05)**

★ ගිනි දලු වැනි දිව් ★ සැඩ සුළඟ ක්‍රියා 2:2-3)

**16. මුල් කිතුනු සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න (2012/07)**

★ ඉගැන්වීම ★ රොටී කැඩීම ★ සහභාගිකම
★ යාච්ඤාවෙහි නිරතවීම ★ සියල්ල පොදුවේ තබාගැනීම

**17. මෙරට පෘතුගීසි යුගයේදී ධර්මදූත සේවාව සඳහා පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම් දෙකක් නම් කරන්න (2010/10)**

ප්‍රැන්සිස්කානු නිකාය ජේසු නිකාය
අගුස්තීනු නිකාය දොමිනිකානු නිකාය

**18. ලන්දෙසි පීඩන සමයේදී බිඳ වැටුණු කතෝලික විශ්වාසය යළිත් ගොඩ නැඟීමට දායක වූ මිෂනාරි පියතුමන්ලා දෙදෙනෙකු නම් කරන්න (2008/04)**

★ භාග්‍යවත් ජුසේවාස් පියතුමා (1687)
★ ජෝශප් කාර්වල්හෝ පියතුමා (1696)
★ ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා (1705)

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

# ළමා කතා ලියූ ක්‍රිස්තියානි විශ්ව ලේඛකයෝ 01

## ''එකමත් එක කාලෙක''

## ළමා සුරංගනා කතා ලෝකෙට හඳුන්වා දුන් ක්‍රිස්තියානි ලේඛකයන් තිදෙනා

''සින්ඩරෙල්ලා'', ''හිම කුමාරි'', ''නොපෙනෙන වස්ත්‍රයක් ඇඳි රජ තුමා'', ගැන නො ඇසූ කෙනකු මෙලොව නැති තරම්ය. අප රටේ හැම ළමා ළපටියෙක්ම මේ කතා වලට බෙහෙවින් ඇලුම් කරන අතර අද වැඩිහිටියන් පවා එකල ළමා අවධිය තුළ සිටියදී මේ කතා ඉමහත් ආශාවකින් රස වින්ද ඇත. මුළු මහත් ලෝකයේම ළමා ළපටීන් පමණක් නොව පරම්පරා ගණනාවකම වැඩිහිටියන් පවා ඔවුන් හඳුනති. කථාව කට පාඩම් කොට මෙන් නැවත නැවත ස්මරණය කරමින් සිහිපත් කරන්නට රුචිකත්වයක් දක්වති. නමුත් මේ චරිත මවා රසවත් කතා ඔවුන් වටා ගෙතූ කතුවරුන් තිදෙනා ගැන දන්නේ ඉතා ටික දෙනෙකි.



ශ්‍රී ලංකාවෙන් සැතපුම් දහස් ගණනක් ඈත දෙරටක නමුත් එකම කාලයක එනම් මීට වසර එකසිය පනහකට පමණ පෙර මේ සුරංගනා කතා පහළ විය. එකරටක් ඩෙන්මාර්කයයි. අනෙක ජර්මනියයි. ඩෙන්මාර්කයේ හැන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් ළමුන් සඳහා සුරංගනා කතා රචනය කරන අවධියකම වාගේ ජර්මනියේ ග්‍රිම්සොහොයුරෝද සුරංගනා කතා රචනයෙහි නිරත වූහ. එහෙත් එකල ඔවුන් කතා රචනය කරද්දි. තම කෘතින් කෙදිනක හෝ ලෝ පතළ ජනප්‍රියත්වයක් ලබතැයි එක් අයෙක්වත් නොසිතූහ. නමුත් අද ඇන්ඩර්සන්ගේ සුරංගනා කතා මෙන්ම ග්‍රිම් සොහොයුරන්ගේ සුරංගනා කතාද ලොව නොයෙකුත් රටවල ප්‍රචලිත වී තිබේ. මොවුනතුරෙන් ඇන්ඩර්සන්ගේ ජීවිත කතාවද සුරංගනා කතාවකට බෙහෙවින්ම සමානය.

ඔහු 1805 අප්‍රියෙල් 2 වනිද ඩෙන්මාර්කයේ ඔඩෙන්ස් නගරයේ මුඩුක්කුවක උපත ලැබුවෙකි. පියා සපත්තු සාදන්නෙක් විය. ඇන්ඩර්සන්ට වයස අවුරුදු එකොලහේදී යුද්ධයට ගිය පියා මිය ගියේය.මව තවකෙකු හා විවාහ විය. කුඩා ඇන්ඩර්සන් රැකියාවන් කිහිපයක්ම ඉගෙනීමට තැත් කළත් තම මිතුරන්ගේ විහිලුවත් බාප්පාගේ නොසැලකිල්ලත් නිසා කළ කිරුණේය. ''ප්‍රසිද්ධිය ලැබීම සඳහා'' (ඔහුගේ වචන වලින්) කෝපන්හේගන් නගරයට යෑමට ඉටා ගත්තේය. ඇන්ඩර්සන් කැටය කඩා ඉතිරි කළ සුලු මුදලත් රැගෙන අගනුවරට සම්ප්‍රාප්ත විය. එහිදි ඔහුගේ එකම අභිප්‍රාය වුයේ රාජකීය නාට්‍යවල රැකියාවක් ලබා ගැනීමටය. ගායකයකු, නැට්ටුවකු, නළුවකු හෝ නාට්‍ය රචකයකු ලෙස දස්කම්පා ප්‍රසිද්ධියට පත්වීමට ඔහු සිහින දකිමින් පසුවිය. එහෙත් මෙහිදීද අවාසනාව ඔහු පසුපස ලුහුබඳින්නට විය. දිනක් ඔහුට රජතුමා ඉදිරියෙහි ගායනා කිරීමට අවස්ථාවක් ලැබුණි. ඔහුගේ ගායනයට කරුණිකව සවන් දුන් රජතුමා ඔහුට උවමනා කුමක් දැයි ඇසීය. ''මට රාජකීය නාට්‍යවල රඟ පෑමට සහ කතා රචනය කිරීමට ඕනා'' ඇන්ඩර්සන් නොපැකිලව පිළිතුරු දුන්නේය. ''ගායනය කරන්න පුළුවන් වුනාට නාට්‍ය ලියන එක ලේසි දෙයක් නොවෙයි. මං නුඹට අවවාද කරන්නේ අල්මාරි සෑදීම වැනි ප්‍රයෝජනවත් රැකියාවක් ඉගෙන ගන්න''යි රජතුමා ඔහු තැනූ මාලිගා බිඳමින් කීය. එහෙත් ඔහු බලාපොරොත්තු අත් නොහළේය. නාට්‍ය කිපයක්ම රචනය කළේය. ඒ එකක්වත් රඟ දක්වීම සඳහා නුසුදුසු බව රාජකීය නාට්‍ය අධ්‍යක්ෂ වරුන්ගේ තීරණය විය. ඇන්ඩර්සන්ට යන එන මං නැති විය.

නුදුරු අනාගතයේ ලෝ පතළ කීර්තියක් විඳීමට වරම් ලැබ සිටි ඔහුට ඔහුගේ ප්‍රබල අධ්‍යාත්මය විසින් නව මාර්ගයක් විවෘත කරනු ලැබිණ. ඔහුගේ කෘතිවල සැඟවුනු දස්කමක් තිබෙනු දුටු රාජකීය නාට්‍යවල අධ්‍යක්ෂකවරයකු වූ ජොනාස් කොලින්ස් ඇන්ඩර්සන්ගේ ආධාරයට පැමිණියේය. ඔහු අරමුදලක් අරඹා ඇන්ඩර්සන්ව ස්ලැගැල්සි නගරයේ පාසලකට යැවීමට කටයුතු සැලැස්වීය. මෙය මෙයිස්ලිං නැමැත්තකු විසින් පවත්වනු ලැබූ පාසලක් විය. ඇන්ඩර්සන්ට මෙයිස්ලිං සමග ජීවත් වීමට සිදු විය. ඇන්ඩර්සන්ට මෙයිස්ලිං ගෙදර ළමුන් බලා කියා ගැන්මටද සිදු විය. ඇන්ඩර්සන් ඔවුන්ව උකුල මත තබාගෙන කතන්දර කී ය. එහෙත් මෙයිස්ලිංගෙන් ඔහුට සැනසිල්ලක් නොවීය. ඔහුට ශාස්ත්‍රයට වඩා මෙයිස්ලිං ගෙන් ලැබුනේ අතවර පමණි. මෙය දැනගත් කොලින්ස් ඔහුව එතැනින් අස්කර ගත්තේය. 1828 දී ඔහු කෝපන්හේගන් විශ්ව විද්‍යාලයට බැඳුනේය. මේ කාලයේ ඔහුව නඩත්තු කරනු ලැබුයේ කොලින්ස්ගේ මිතුරු පවුල් කිහිපයක් විසිනි. ඇන්ඩර්සන් ඒ නිවෙස්වල කුඩා ළමුන් ලඟ තබාගෙන කතා කීමට අමතක නොකළේය. ඔහු කොතරම් දක්ෂ ලෙස කතා කීවේද කියතොත් එහි චරිතයන් ඔවුන් ඉදිරියේ මැවී පෙනෙන්නාක් මෙන් විය. ළමෝ ඔහුට ප්‍රිය කළහ.

**ලක්ෂමන් වික්‍රමසිංහගේ**
**ලිපියකින් කරුණු උපුටා ගැණිනි.**


**සංස්කාරක පියතුමන් විසිනි**

(ලබන සතියට )

# ලොව වටා පිහිටි අසා

### සිරිකුරුසියේ යැදුම් කුටිය

ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇරිසෝනා ප්‍රාන්තයේ සෙඩොනා හි කඳු බෑවුමක තනා ඇති අසාමාන්‍ය දෙව්මැදුරකි. මූර්ති ශිල්පිනි මර්ගරීටා බෲන්ස්වින්ගේ සිතිවිල්ලක් අනුව නිර්මාණය වූ මේ දෙව්මැදුර අවුරුදු $1^{1/2}$ තනා නිමවු අතර 1956 දී නිමවු ඊට ඇමෙරිකාන ඩොලර් ලක්ෂ තුනක් වැයවිය. 1957 දී ඇමෙරිකාන ගෘහනිර්මාණ ශිල්පින්ගේ ආයතනයේ ඇගයුමට ලක්වු මේ යැදුම් කුටිය 2007 දී ඇරිසෙව්නියාවේ මිනිසුන් තැනූ පුදුම හත අතරට ද එක්විය.


සිරි කුරුසියේ යැදුම් කුටිය

### අයිස්ලන්තයේ දෙව්මැදුර

අයිස්ලන්තයේ විශාලතම දෙව්මැදුර වන මෙය මීටර් 74.5 උසවේ. 1937 දී සැලසුම් කළ මේ දෙව්මැදුර ගොඩ නැගීමට වසර 38 ක් ගතවිය. 1945 ඇරඹු එය 1986 දී නිමාවිය. නැරඹුම් කුළුණක් ලෙසද භාවිත වන මෙහි ඉහළ සිට බැලු කල අවට කඳුකර ප්‍රදේශ අපූරුවට දැකගත හැකිය. 2008 දී දෙව්මැදුරේ බරපතල ප්‍රතිසංස්කරණ සිදුවූ අතර දැන් ඒවා නිමාවී ඇත.


අයිස්ලන්තයේ දෙව්මැදුර

### මැරින්ගා ආසන දෙව්මැදුර

බ්‍රසීලයේ පරානා මැරින්ගා හි පිහිටි මීටර් 124 උසැති රෝමානු කතෝලික ආසන දෙව්මැඳුරකි. දකුණු ඇමෙරිකාවේ උසම දෙව්මැදුර මෙයවන අතර ලෝකයේ උසම ගොඩනැගිලි අතර 16 වැනි ස්ථානයේ පිහිටා තිබේ. සෝවියට් රුසියාවේ ස්පුට්නික් චන්ද්‍රිකා දැකීමෙන් ආනන්දයට පත් ගෘහ නිර්මාණ ශිල්පි ජෝස් අගුස්ටෝ බෙලුස්සි විසින් මේ ආසන දෙව්මැදුර සැලසුම් කළේය. අති උතුම් ඩොම් ජායිම් ලුයිස් කෝල්හෝ අගරදගුරු හිමිපාණෝ එය අනුමත කළහ.

අත්තිවාරම සඳහා රෝමයේ සාන්ත පීතර බැසිලිකාවෙන් ලබාගත්


ශාක පත

## ඔබ දන්නවාද?



1. රට රටවල භාවිත වන මුදල් වර්ග මොනවාද

ඔස්ට්‍රේලියාව (ඕස්ට්‍රේලියානු ඩොලර්)
බහරේන් (බහරෙන් ඩිනාර්) බංගලාදේශය (ටැකා) කැනඩා (කැනේඩියානු ඩොලර්) ඊජිප්තුව (ඊ:පවුම්) හොංකොං (හොංකොං ඩොලර්) පකිස්ථානය , ඉන්දියාව , ශ්‍රී ලංකාව හා මාලදිවයින (රුපියල් සත) චීනය (යු ආන්) ජපානය (යෙන්) ජෝර්දානය (ඩිනාර්) මැලේසියාව (රිංගිට්) නොර්වේ (ක්‍රෝනි) ඕමානය (රියාල්) කටාර් (රියාල්) සිංගප්පූරුව (සි.ඩොලර්) ස්විස්ටර්ලන්තය (ස්විස් ෆ්‍රෑන්ක්) තායිලන්තය (බාත්) තායිවානය (තායිවාන් ඩොලර්) සෞදි අරාබිය (ඩිනාර්) ඇමරිකාව (ඇ.ඩොලර්) එක්සත්රාජධානිය (පවුම්) බෙල්ජියම, සයිප්‍රසය, පිංලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, අයර්ලන්තය, ඉතාලිය, ලැක්ස්හැම්බර්ග් මාර්ටිනිකිව් , මයෝට්, මොනාකෝ, නෙදර්ලන්තය, පෘතුගාලය, සෝලෝවේනියා, ස්ලෝවැනියා (යුරෝ)

ඉදිරිපත් කිරීම
මැක්සිමස් රෝයි පෙරේරා මාමාගෙනි.

ඉදිරියට .......

# මානය දෙව්මැදුරු

## කිතුනු උරුමය



නෝර්වේ ඩෑම් ඩු හුට් යැදුම් කුටිය

ගල් කැබැල්ලක් අති උතුම් දොලොස්වන පියුස් සසුන් පියාණන් විසින් ආසිරි ගන්වනු ලදුව 1958 අගෝස්තු 15 වැනිදා තැන්පත් කරන ලදී. 1959 ජූලි සිට 1972 මැයි 10 වැනිදා දක්වා ඉදිකිරීම් කටයුතු කර නගරයේ 25 වැනි උපත් දිනයට ආසිරි ගැන්විය.

**නෝර්වේ ඩෑම් ඩු හුට් යැදුම් කුටිය**

ප්‍රංශයේ රොන්චැම්ප් හි නොර්වේ ඩෑම් ඩූ හුට් යැදුම් කුටිය වන්දනා කරුවන්ගේ දෙව්මැඳුරකි. වර්ෂ 1955 ජූනි 25 වැනිදා ආසිරි ගන්වා තිබේ. නැගෙනහිර ප්‍රංශයේ දේවමාතාවන්ට කැපකළ වන්දනා කරුවන්ගේ දෙව්මැඳුරක් තිබූ අතර දෙවන ලෝක මහා සංග්‍රාමයේදී එය විනාශ විය. ඒ වෙනුවෙන් ඉදිවූ නව දෙව්මැඳුර මෙයවේ.



යැදුම් කුටිය

**ශාඛා පත්‍ර යැදුම් කුටිය - ජපානය**

ජපානයේ යමනාෂි කොබුචිසාව් හෝටල් සංකීර්ණයක් තුළ 2004 වසරේ ඉදිකළ මේ යැදුම් කුටිය විවාහ මංගල දේව මෙහෙයයන් පැවැත්වීමට යොදා ගැනී.

කොළ හෙවත් පත්‍ර දෙකකින් සමන්විත එහි එක් පත්‍රයක් වීදුරු වලින් ද අනික් පත්‍රය සුදු යකඩ වලින්ද නිර්මාණය කර ඇත. වීදුරු පත්‍රයේ අපූර්ව ලේස රටාවන් නිමවා ඇති අතර ක්‍රම ක්‍රමයෙන් මහත වැඩි වන වීදුරු වලින් නිර්මිතය.

සුදු යකඩ තහඩුවේ සිදුරු 4700 ක් ඇති අතර ඒ සෑම සිදුරකටම ඇති ලැක් පළිඟුවක් සවිකර ඇත. එමගින් මනමාලියගේ සාරියේ අපුරුරටාවනට සමාන රටා මවන්නට මේවා සමත්වේ. මෙහි 80 දෙනකුට ඉඩකඩ ඇති අතර කුටිය අභ්‍යන්තරයේ අපූර්ව හැඩයක් ගෙන ඇත.



මැරින්ගා ආසන දෙව්මැඳුර

ශිරාන් මෛත්‍රි


මාසික සිතිවිල්ල

සේයා :-
අශේන් එස්. සේනාරත්න



මා සි ක සි ති වි ල් ල

"සැප්තැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, , ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 108

## Wish (විෂ්)

ඒ වගේම අතීතයට අදාළ යමක් ගැන එහෙම කියනවනම් Past Perfect ස්වරූපයෙන් තිබිය යුතුයි. (අපි Past Perfect ගැන කලින් ඉගෙන ගෙන තියෙනවා. (had + Past Participle)

නිදසුන් :-
I wish I had invited him,
(අයි විෂ් අයි හැඩ් ඉන්වයිටඩ් හිම්)
මට හිතෙනවා මං එයාට ආරාධනා කරල තිබුණ නම් හොඳයි කියල.

I wish I had known about his birthday. I could have given him a present.
(අයි විෂ් අයි හැඩ් නෝන් එබවුට් හිස් බර්ත් ඩේ. අයි කුඩ් හැව් ගිවන් හිම් අ ප්‍රසන්ට්)
මම ඔහුගෙ උපන්දිනය කලින් දැනගෙන හිටිය නම් ඔහුට තෑග්ගක් දෙන්න තිබුණා. (කලින් දැනගෙන හිටියෙ නෑ)

මෙතනදී අදහස් වෙන්නෙ උපන් දිනය දන්නව නම් කියන එක නෙමේ. දැනගෙන හිටිය නම් කියන අතීත ස්වරූපයයි.

ඉහත වැකි වලදී අතීත ස්වරූපය යුතු අදහසක් Wish සමග යොදන හැටියි දැක්වෙන්නෙ. ඊළඟට Can (පුළුවන්) කියන වචනය ආශ්‍රිතවත් අපිට wish යොදන්න සිදුවෙන අවස්ථා තියෙනවා.

"මට යමක් කරන්න පුළුවන් වුනා නම් කියල හිතෙනවා. නමුත් මට යමක් කරන්න හැකියාවක් නැහැ." කියන අදහස ප්‍රකාශ කරද්දී අපිට මේ "Can" ආශ්‍රිතවයි Wish භාවිතා කළ යුත්තෙ. මෙහිදීත් අපි Wish සමග යොදන්නෙ "Can" කියන පදය නොව ඒකෙ අතීත ස්වරූපය ලෙස සැලකෙන Could බවත් මතක තියාගන්න.

I wish I could help you. But I'm sorry, I can't do anything.
ඔබට උදව්වක් කරන්න තිබුන නං කියල හිතෙනවා. ඒත් කණගාටුයි. මට කිසිවක් කරන්න බෑ.

I'm sorry, I have to go. I wish I could stay longer.
කණගාටුයි, මට යන්න තියෙනවා. මට තව ඉන්න තිබුණ නං කියල හිතෙනවා. (ඒත් ඉන්න විදියක් නෑ)

I wish I could remember his name.
මට ඔහුගෙ නම මතක තිබුණ නං කියල හිතෙනවා. (ඒත් මතක නෑ)

අතීතයේදී කළා නම් හොඳයි කියල දැන් හිතෙනවා) යන අදහස කීමටත් අපිට මේ විදිහට පුළුවන්. ඒත් ඒකට භාවිතා කරන්නෙ Past Participle.

I hear the party was great.
I wish I could have gone

පාටිය හොඳට තිබුන කියල ආරංචියි. මමත් ඒකට ගියා නං (ගිහින් තිබුන නං) හොඳයි කියල හිතෙනවා.
**මේ වැකි දිහා බලන්න.**

1. I wish I had a cat.
2. I wish somebody would buy me a cat.


පළමුවැනි වැකියෙන් කියැවෙන්නෙ
"මට බළලෙක් හිටිය නං කියල හිතෙනවා" කියන අදහස...
(බළලෙක් හිටිය නං කොච්චර හොඳද?)
දෙවැනි වැකියෙන් කියැවෙන්නෙ
"කව්රුහරි මට බළලෙක් ගෙනත් දුන්න නං"
(එහෙම වුනා නං කොච්චර හොඳ ද?)

1) I wish Kumari was (හෝ were) here.
2) I wish kumari would come.

පළමු වැකියේ අදහස - "කුමාරි හිටිය නං කොච්චර හොඳ ද? දෙවැනි වැකියේ අදහස - "කුමාරි ආවා නං හොඳයි කියල හිතෙනවා. ඉහත වැකි වල පළමු වැකියෙන් කියැවෙන්නේ යම් කිසි තත්ත්වයක් ගැන.

දෙවැනි වැකියෙන් කියැවෙන්නෙ යම් ක්‍රියාවක් පිළිබඳව.
I wish ...... would - යෙදෙන්නෙ ක්‍රියා (action) වලට පමණක් බව මතක තබා ගන්න.
I wish I + (අතීත පදය) යෙදෙන්නෙ තත්ත්වයක් ගැන කීමට පමණක් බවත් මතක තබා ගන්න.

# දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් පිළිබඳව පළවන ප්‍රහේළිකා



### හරහට

1. කුරේ හිමියන් මෙම නුවණින් පූර්ණවූවෙකු බව කාගෙත් මතයයි.
4. කුරේ හිමිපාණන් උපන්නේ මීගමුවේ සිට සැතපුමක් ඇතින් පිහිටි මෙම ග්‍රාමයේ ය.
6. මෙතුමා මෙම සෞන්දර්යයට බොහෝ සේ ඇලුම් වූවෙකි.

### පහළට

2. කුරේ හිමිපාණන්ගේ ප්‍රියතම එක අකුරේ ශාකය මෙයයි.
3. මෙම ධූරයෙන් පිදුම් ලැබූ ප්‍රථම සිංහල ජාතික පියතුමා මෙතුමාය.
5. කුරේ හිමිපාණන්ගේ නමේ කොටසකි.


**අගරදගුරු පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථානය අගරදගුරු මැදුර කොළඹ 08. ඔක්තෝබර් 05 ට පෙර මෙම ලිපිනයට එවන්න.**


### හරහට

1. කුරේ හිමිපාණන් විසින් කැකිරාව මීසමේ ඇති කළ කතෝලික ගම්මානයකි.
4. දිළිඳු යන්නට තවත් පදයකි.
6. කුරේ හිමිපාණන් උපන්නේ 1909 වර්ෂයේ මෙම මාසයේදීය.
8. උන්වහන්සේ නිදාගත්තේ මෙම ලණුවලින් වියන ලද ඇඳක පැදුරක් දමාගෙනය

### පහළට

2. මෙම ධූරයෙන් පිදුම්ලැබූ ප්‍රථම සිංහල ලාංකීක පියතුමා මෙතුමාය.
3. ලංකා අප ස්වාමිදූ වෙනුවෙන් කුරේ හිමිපාණන් විසින් ප්‍රදානය කළ උතුම්ම තිළිණය ලෙස සැළකිය හැකි බැසිලිකාව පිහිටියේ
5. කුරේ පියතුමන් මෙම නුවණින් පරිපූර්ණ පුද්ගලයෙකු බව කාගෙත් විශ්වාසයයි.
7. මෙතුමා අගරදගුරු ධූරයට ඔසවනු ලැබුයේ 1947 වසරේ මෙම මාසයේදීය .





### හරහට


2. කුරේ හිමියන්ගේ පියාගේ නම මෙයයි.
4. කුරේ හිමියන් කාදිනල් ධූරයට නම් කෙරුණේ 1965 වසරේ මෙම මාසයේය.
5. සාන්තුවරයට එසවීම සඳහා යෝජනා කිරීමෙන් ඒ සඳහා ශුද්ධාසන අනුමැතිය ලැබීමෙන් පසු එකී පුද්ගලයා හඳුන්වනු ලබන්නේ මෙම නාමයෙනි.
8. මෙතුමාගේ දේහය බැසිලිකාවේ දෙව්මැදුරේ මෙම මහලේ තැන්පත්කර ඇත.
10. බිෂොප්ධුරය එකල ගැමියන් හැඳින්වුයේ මෙනමිනි.
3. මෙතුමා විසින් ගොඩ නැගුනු කාගම කතෝලික ගම්මානය අයත්වන්නේ මේ මීසමටය.
6. කුරේ හිමිපාණන් විශ්‍රාමිකව සිටියේ තේවතු පුදබිමේ මෙම නිවසේය.
7. එකල ගැමියන් කුරේ හිමිපාණන් හැඳින්වුයේ මෙනමිනි.
11. සොබා ධර්මයට ප්‍රියකළ කුරේ හිමිපාණන්..... විද්‍යා වේදියෙකුවේ.
9. කාදිනල් හිමිපාණන් අයත් වූ නිකාය කෙටියෙන් හඳුන්වන්නේ මෙලෙසයි.

### පහළට

1. මෙම ධූරයෙන් පිදුම් ලැබූ ප්‍රථම ස්වදේශිකයා කුරේ පියතුමන්ය.

## පුංචි අපේ චිත්‍ර පිටුව





**ය හෘදයේ ජේසුනි**

**වෝන් ශෙනන් රිංස්ලි**

06 ශ්‍රේණිය

. පාවුළු දහම් පාසල

නෙලුම්පිටිය

(දලුපත මීසම)




**ශ්‍රී ශරීරය හා රුධිරය**

**දිලුනි ද සිල්වා**

04 ශ්‍රේණිය

සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය

කොළඹ 07



**ශුද්ධවූ ෆාදර් පියෝ මුනිතුමා**

**ඇන්ටන් මල්ෂාන්**

10 ශ්‍රේණිය

ගොන්සාල්වෙස් මහ විදුහල

පමුණුගම



**ගිරා පවුලක්**

**රිද්මික මධිෂ සිල්වා**

03 ශ්‍රේණිය

ශා. නිකුලා දහම් පාසල

මුන්නක්කරය (මහවිදිය මීසම)

**ය පිරිසිදුව තබා ගනිමු.**

**සහිනි ඈන් මදුෂිකා පෙරේරා**

08 ශ්‍රේණිය

සා. අන්තෝනි දහම් පාසල

ලියනගෙමුල්ල



**චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.**

**"පුංචි අපේ චිත්‍ර පිටුව" ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**



සුදුවර චරිත

# ශු. ඉරනේයස් මුනිතුමා



ක්‍රි.ව. 130-140 පමණ කාලයේ දී සුළු ආසියාවේ ස්මිර්ණා නුවර උපත ලද බවට සැලකිය හැකිය. මව්පියන් ගැන හෝ කුඩා කාලයේ ආගමික ජීවිතය ගැන හෝ එතරම් යමක් කිව නොහැක. කෙසේ වෙතත් කුඩා අවධියේ සිට පොලිකාප් තුමාගේ ඇසුර ලැබූ බවට නම් සාක්ෂි ඇත. එව්සෙබියස් තුමාට අනුව ඉරනේයස් තුමා විසින් ෆ්ලොරිනස් තුමාට ලියන ලද ලිපියෙහි සඳහනකට අනුව ඉරනේයස් තුමා පොලිකාප් තුමාගේ දේශනාවලට සවන්දී ඇත.


ක්‍රි.ව. 170 දී ප්‍රංශයට පදිංචිය සඳහා ගිය මෙතුමා පසුකලක ලියෝන්ස් නුවර රදගුරු තනතුරට පත්වූ බව ඉතිහාසයේ දැක්වේ. ක්‍රි.ව. 177 දී පොන්තීනස් මුනිතුමා ලියෝන්ස් නුවර රදගුරු ලෙස කටයුතු කළ කාලයේ ඉරනේයස් තුමා පූජක තුමකු ලෙස සිටි බව ඉතිහාසය සඳහන් කරයි. මේ කාලයේදී එතුමා කෙල්ටික්වරුන් (**Celtics**) අතර ක්‍රිස්තුධර්මය ප්‍රචාරය කිරීමට හා සභා සමගිය හා සාමය ඇති කිරීමට මහත් උත්සාහයක් දරා ඇත. පාස්කු දිනය පිළිබඳව සුළු ආසියාවේ රදගුරු වරුන් හා රෝම රදගුරුවරයා අතර ඇතිවූ ආරාවුලක් සමතයට පත් කළේ අයිරේනියස් තුමාය. නොස්ටික් වාදය, ජුදෙව් වාදය හා ග්‍රීක දර්ශන වාදය යන විවිධ මත වාදවලින් ක්‍රිස්තු ධර්මය ආරක්ෂා කර ගැනීමට අයිරේනියස් තුමාගෙන් වූ සේවය අතිමහත්ය. අයිරේනියස්ගේ පොත්වලින් අදට ඉතිරිව ඇත්තේ පොත් දෙකක් පමණයි. එකක් නොස්ටික් වාදයට විරුද්ධව ලියූ පොතකි. අනික අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම් පිළිබඳ ලියන ලද ග්‍රන්ථයකි. නොස්ටික් වාදයට විරුද්ධව ලියන ලද ග්‍රන්ථයේ කාණ්ඩ පහකි. ග්‍රීක භාෂාවෙන් මෙහි මුල් පිටපත ලියා ඇත. නමුත් ඒවා විනාශවී ඇති බැවින් අඩංගු කරුණු ගැන යමක් කිව නොහැක. ලතින් පරිවර්තනයකින් කළ කාණ්ඩයක් හා අර්මේනියානු පරිවර්තනයකින් කළ කාණ්ඩයක්ද ඉතිරිව ඇත. මේනිසා මෙම ග්‍රන්ථයේ අඩංගු කරුණු බොහෝමයක් දැනගත හැකිවී ඇත්තේ ලතින් පරිවර්තනයෙනි.

ඔහු විසින් ලියනලද ප්‍රධාන කෘතිය වන මෙම ග්‍රන්ථය ලියා ඇත්තේ නොස්ටික් වාදී මත ඉදිරිපත් කළ වැලන්ටිනස් (**Valentinus**) හා මොන්ටෙනස් (**Montenus**) යන අයගේ මිත්‍යා මත ප්‍රතික්ෂේප කිරීම සඳහාය. මෙහි පළමු කොටස ඥානවාදීන්ගේ ඉගන්වීම් වල අසත්‍යභාවය ගැන කතාකරයි. දෙවන කොටස දර්ශනවාදය පදනම් කරගෙන මෙම දුර්මත ගැන කරුණු ඉදිරිපත් කරන අතර ඒවා සභාවේ ධර්මයට පටහැනි වන්නේ කෙසේද යන්න ගැන විස්තර කරයි. අනෙක් කොටස් තුන සභා සම්ප්‍රදායන් හා ශුද්ධවූ ලියවිල්ල පදනම් කරගෙන සභාවේ නියම ධර්මය ගැන කතා කරයි. අවසන් වශයෙන් ඥානවාදීන්ගේ ඉගන්වීම් ප්‍රතික්ෂේප කරමින් තර්කාණුකූලව ඒවා බිඳ දැමීමට ඉරනේයස් තුමා උත්සහ දරා ඇත. මෙලෙස අවසන් කොටස් තුන තුළ කතෝලික විශ්වාසයේ පදනම (**Rule of the Catholic Faith**) ගැන කතා කරයි. අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම් යන කෘතිය (**The Presentation of the Apostolic Teaching**) ඔහුගේ දෙවන කෘතියයි. ඔහු මෙහිදී බයිබලය පදනම් කරගෙන දෙවියන් වහන්සේ තමන්වහන්සේවම දීර්ඝ කාලයක් ඔස්සේ මිනිසාට එළිදරව් කරමින් මිනිසා සමග කිට්ටු සම්බන්ධයක් පවත්වා ගෙන ගොස් අන්තිමේදී ක්‍රිස්තුස් වහන්සේ තුළ උන්වහන්සේගේ නියම ක්‍රියාකාරිත්වය හා නියම ස්වභාවය අනාවරණය කළ ආකාරය බයිබලය ආශ්‍රයෙන්ම පෙන්වා දෙයි. ඔහු ජොහාන් සුබ වදනේ සඳහන් පෙරවදන අනුව ක්‍රිස්තුන් වහන්සේ ලෝගොස් (**Logos**) හෙවත් දෙවියන් වහන්සේගේ වචනය බවත් උන්වහන්සේගේ සම්පූර්ණ ප්‍රේමය බවත් ක්‍රිස්තුන් වහන්සේ දෙවන ආදම් බවත් ප්‍රකාශ කළේය. එමෙන්ම මාංශවත් ක්‍රිස්තුන් වහන්සේ පූර්ණ මිනිසෙක් බව කියමින් සුභාරංචි සතරේ ඇති උත්තරීතර බවට මුල් තැන දියයුතු බව තරයේ කියාපායි. සත්‍ය පැහැදිලි කිරීමේදී නිතරම අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම් අනුව එය සිදුවිය යුතු බව කියන ඉරනේයස් තුමා ක්‍රිස්තු සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය බවද පවසයි.

එබැවින් එම ශරීරයේ පැවැත්ම ශුද්ධවූ ලියවිලි අනුව වියයුතු බවද ඉරනේයස් තුමා පැවසුවේය. ඉරනේයස්ගේ දේව ධර්මයේ මූලික තැනක් ක්‍රිස්තුන් වහන්සේට හිමිවේ. මැවිල්ලේ මූලිකයා හෙවත් ප්‍රථම මැවිල්ල ක්‍රිස්තුන් වහන්සේ බව කියන මෙතුමා මිනිසාගේ විමුක්තිය සඳහා උන්වහන්සේ මිනිසත් බව ගෙන ලොව පහළවූ බවත් මේනිසා ක්‍රිස්තුන් වහන්සේ නව මිනිසා හා නව ආදම් බවත් පවසයි. ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ කාර්යය මගින් ඇතිවූ සාතන්ගේ පරාජය මානව විමුක්ති ඉතිහාසය තුළ සිදුවූ සාතන්ගේ ප්‍රධානම පරාජය බව එතුමා පෙන්වාදෙයි. නමුත් මේ පරාජයෙන් අත්වූ ජය නැතහොත් ගැලවීම යමෙකු හිමිකරගත හැක්කේ ක්‍රිස්තුන් වහන්සේ විසින් පිහිටුවන ලද උන්වහන්සේගේම ශරීරය වන ක්‍රිස්තියානි සභාව තුළින් පමණක් බවද ඔහු පවසයි. දේව ධර්මය තුළ ක්‍රිස්තු භක්තිකයා රැඳී සිටිය යුතුය යන මතය ඉරනේයස් තරයේ විශ්වාස කළේය. ඒ සඳහා අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම මත කිතුනුවා රැඳී සිටිය යුතු බව ඔහු අවධාරණය කළේය. කිතුනු ජීවිතයේ මූලික අරමුණ දෙවියන්ට සම්බන්ධවීම නැතහොත් දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපයක් (**Image of God / imago Dei**) බවට පත්වීම යැයි ඔහු ප්‍රකාශ කළේය.

පූජකැඩීමේදී හෙවත් ශුද්ධ සහභාගිකමේදී යොදාගන්නා පූපවල ක්‍රිස්තුන් වහන්සේ ජීවමානව වැඩවසනබව ඔහු කියා සිටියේය. ඔහුගේ දේවධර්මය තුළ කැපී පෙනෙන සාධකයක් නම් එතුමා නිතරම ශුද්ධ ලියවිලි පාඨ ඇසුරෙන් වාග් මාලාව හැසුරවූ බවයි. ඔහු ක්‍රිස්තු කේන්ද්‍රීය දර්ශනයකින් පුරාණ ගිවිසුම දෙස බලන අතර මැවිල්ලට පෙරත් ක්‍රිස්තුන් වහන්සේ සිටි බව අනාවරණය කිරීමට උත්සහ දරයි. ඔහුගේ දේව ධර්මය බයිබලය (**Scripture**) හා සභාවේ ඉගැන්වීම් (**Tradition**) මත පදනම් වී ඇත. එබැවින් සභා මාතාව ඔහු ශ්‍රේෂ්ඨ දේව ධර්මාචාර්ය වරයකු ලෙස සලකයි. නොස්ටික් වාදය, ජුදෙව් වාදය හා ග්‍රීක දර්ශන වාදය යන විවිධ මත වාදවලින් ක්‍රිස්තු ධර්මය ආරක්ෂා කර ගැනීමට අයිරේනියස් තුමාගෙන් වූ සේවය අතිමහත්ය. මෙතුමා ක්‍රි.ව. 202 දී වේද සාක්ෂිවරයෙකු ලෙස දිවි පිදුබව කියවේ.

**අසේල දසනායක**



## ප්‍රහේළිකා අංක 40

**හරහට**

1.ඔවුන් ක්‍රිස්තුන් වහන්සේව ඇණ ගසන පිණිස හේබ්‍රෙව් බසින් මෙසේ හඳුන්වන කපාල පිටිය නම් ස්ථානයට උන්වහන්සේව ගෙනගිය සේක.

4. ''පටු දොරටුවෙන් ඇතුල් වන්න.....කරන්න'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක හිස්තැනට සුදුසු වචන

5. රැකියාවක් කිරීමේ යුතුකම තෙසලෝනික වරුන්ට පහදා දෙමින් ශු. පාවුලු තුමා කිසිවෙකුට බරක් නොවන පිණිස දිවා රෑ දෙකේ මෙසේ වැඩකළ බව ප්‍රකාශ කළේය.

8. ඊශ්‍රායෙල් ජනතාව මුහුද මැදින් ගත් පසු දෙබෑවූ මුහුදු ජලය මැදින් ගමන් ගැනීමට පැමිණි පාරාවොගේ යුද හමුදාවද මෙම රථද ජලය නැවත එක්වීම නිසා විනාශයට පත් විය.

9. ස්වර්ගය යන වචනයට සමාන වචනයකි.

**පහළට**

1. ''............ නම් බහුලය ගොවීහු විරලය'' ක්‍රිස්තුන් වහන්සේ වදල සේක. හිස්තැනට සුදුසු වචනය.

2.එක් මිනිසෙක් මිදි වත්තක් වගාකොට එය ..... ට අඳයට දී පිටරට ගියේය. යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදළ එක් උපමාවක සඳහන් වේ . මෙහි හිස්තැනට සුදුසු වචනය

3. සිරගතවී සිටි ක්‍රිස්තු භක්තිකයන්ට රහසින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව රැගෙන යාම නිසා මරණයට පත්වූ ලාබාල ශුද්ධ වන්තයෙකි.

6. නටඹුන් වී ගිය දේව මාළිගය නැවත ගොඩ නැගීම පිණිස දෙවි යන් වහන්සේගේ පණිවුඩය රැගෙන ආ දිවැසිවරයාගේ නම

7. පේදුරු තුමාගේ පළමු දේශනයේ මෙසේ සඳහන් වේ. ''ඔබ අදමිටු මිනිසුන් ලවා ක්‍රිස්තුන් වහන්සේව කුරුසියේ ඇණ ගස්වා මරා දැමුවහුය''. මෙහි අදමිටු යන වඩනයට සමාන නමකි.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. මාක් 12, ශු. ලූක් 13, ශු. ජුවාම් 19, ක්‍රියා 2, තෙසලෝනික 3, හග්ගයි 1 , නික්මයාම 13 )**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** – කිරිමැටියාගාර

# නාත්තන්ඩිය ලූර්දු මහා විද්‍යාලයට
## බයිබල් දැනුම මිනුම පයක්..



හලාවත පදවි දීප ව්‍යාප්ත බයිබල් දැනුම මිනුම තරගයේ ජ්‍යෙෂ්ඨ අංශයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට නාත්තන්ඩිය ලූර්දු මහා විද්‍යාලීය කණ්ඩායම සමත්වුණි. ගරු පැට්‍රිෂියා පැවිදි සොයුරිය ,සන්ධ්‍යා ප්‍රනාන්දු ගුරු තුමිය සමඟ ජයග්‍රාහි කණ්ඩායමේ සිසු වියන් ළමා ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු. **(එස්. ෆිලීෂියා)**

**ක්‍රිස්තුරජාණන්ගේ දහම් පාසල**
**ලෙන්චියාවත්ත (රාගම මීසම)**



රාගම මීසමට අයත් ලෙන්චියාවත්ත ක්‍රිස්තුරජාණන්ගේ දේවස්ථානයට අයත් දරුවෝ 18 දෙනෙක් පසුගියද ප්‍රථම වරට දිව්‍යසත්ප්‍රසාද වහන්සේ ලැබුහ. මෙම දෙව්මැදුරේදී පළමු වතාවට ළමුන් දිව බොදුන් ලැබීම විශේෂත්වයකි. මීසම් සේවක ගරු ජූඩ් ලක්ෂ්මන්, ලෙන්චියාවත්ත දේවස්ථානය බාරව කටයුතු කරන මීසම් සහයක ගරු නලින් සුරාජ් පියතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම දිව්‍ය පූජාව පැවැත්විනි. ගරු පියතුමන්ලා, ගරු පැවිදි සොයුරිය සහ දහම් ගුරුවරුන් සමග ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **සුනිල් සිල්වා.**


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
මෝසෙස්
චිත්‍ර කථා රචනය ආනන්ද කල්දේරා..
දෙබස් හා චිත්‍ර ඇස්.වී.පී. සතුආරච්චි
16
මෝසෙස් වැඩ බිමේද..
ඕ.. මේ රජ්ජුරුවරු.. මොන තරම් කෲරර විදිහට..
වද දෙනවද මේ මිනිස්සුන්ව.. මේ මිනිස්සු වහල්ලු වුනාට මගේම ජාතියේ අය නේද...?
හෙබ්‍රෙව් ජාතිකයන්ට ඉතා දරුණු ලෙස පහර දෙන සැටි මෝසෙස්... ~දුටුවේය~
ඕ අනේ.. මනුස්සයෙක් වැටුනා.. කලන්තෙ දාලද කොහෙද..
..ආහ්.. ව... වතුර.. ...වතුර..
හේයි.. නැගිටපං.. ..වැඩ කරපං.. හ්ම්..
?
චටාස්
ආහ්
..චැස්..
ආහ්.. ම්..
ආහ්.. ඔහු මැරී වැටුනා.. රජ්ජුරුවරු මේ තරම් කෲරර විදිහටද මගේ ජාතියේ මිනිස්සුන්ට සළකන්නෙ...
රජ්ජුරු සෙබළාගේ කස පහර වලින් හෙබ්‍රෙව් ජාතිකයා මැරී වැටෙන දුටු මෝසෙස්...
චීස්..
-ඔහ්..